# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

REACHING NATIONS

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVII | MAY 2023 | Issue No. 06


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 32:1-8)**

01. අපරාධයට කමාවත් පාපයට වැස්මත් ලැබූ තැනැත්තේ ආශීර්වාද ලද්දෙක්ය.

02. ස්වාමීන්වහන්සේ යමෙකුගේ ගණනට අයුතුකම නොතබනසේක්ද, යමෙකුගේ සිතේ වංචාවක් නැත්තේද, ඒ මනුෂ්‍යයා ආශීර්වාදලද්දෙක්ය.

03. මා නිශ්ශබ්දව සිටි කල, දවස මුළුල්ලේ හඬා මොරගැසීමෙන් මාගේ ඇට ක්ෂයවිය.

04. මක්නිසාද දිවා රාත්‍රි දෙක්හිම ඔබගේ හස්තය මා පිට බරවිය. මාගේ ඕජස් ගතිය ග්‍රීෂ්ම කාලයේ වියළීම මෙන් විය.

05. මාගේ පාපය ඔබට ප්‍රකාශකෙළෙමි, මාගේ අයුතුකම නොසැඟවීමි. මාගේ වරද ස්වාමීන්ට කියාදෙන්නෙමියි කීමි; ඔබද මාගේ පාපයේ අයුතුකම කමා කළසේක.

06. එසේ හෙයින් ඔබ සම්බවිය හැකි ප්‍රස්තාවයකදී සෑම භක්තිවන්තයාම ඔබට යාච්ඤා කෙරේවා. සැබවින් මහත් ජලධාරාවන් ගලන කල ඒවා ඔහු වෙතට නොපැමිණෙන්නේය.

07. මාගේ සැඟවෙන ඉඩම නම් ඔබය; දුකට නොපැමිණෙන ලෙස ඔබ මා ආරක්ෂාකරනසේක; මිදීමේ ගීතිකාවලින් ඔබ මා වටකරනසේක.

08. ඔබට උගන්වන්නෙමි, ඔබ විසින් යායුතු මාර්ගයෙහි ඔබට ගුරුකම් දෙන්නෙමි. මාගේ ඇස ඔබ කෙරේ යොමුකොට ඔබට දැනමිතිකම් දෙන්නෙමි.

# අලුයම උදාවීමේදී

## AT THE BREAK OF DAWN!

(සහෝදරී ඇන්ඩලින් සෙල්වකුමාරි)



ස්වාමිවූ යේසුස් වහන්සේගේ නාමයෙන් ඔබට සුභ පැතුම් ගෙනෙමු. මෙම කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තුළින් ඔබ හා සමඟ එකතු වීමට ලැබීම ගැන ඉතා සතුටු වෙමු. ස්වාමීන්වහන්සේගේ විශ්වාසවන්තකම මහත්ය. මෙතරම් දුර ගෙන ආ ස්වාමීන්වහන්සේ අවසානය දක්වාම අපව ගෙනයන සේක.

***"දෙවියන්වහන්සේ ඒ මැද සිටිනසේක, එය නොසෙල්වන්නේය. දෙවියන්වහන්සේ අලුයම්හිම එයට උපකාරකරනසේක." (ගීතාවලිය 46:5)***

මෙය ඉතා අනර්ඝ පොරොන්දුවකි. මෙම පොරොන්දුව දුන්නාවූ අවස්ථාව ගැන බලන විටදී, එය ඉතාම අනර්ඝය. ගීතාවලිය 46:2 හි මෙසේ පවසයි.

1. පොළොව වෙනස් විය
2. මුහුද මැද පර්වත සෙලවුනත්
3. ජලය ගුගුරු කැලඹෙතත්
4. පර්වත කම්පාවෙතත්

මෙහිදී සැමදේම වෙනස්වී, සෙලවී, කැළඹිලිකාර තත්වයක පවතින බව දේව වචනය පවසයි. නමුත් මේ සියල්ල මැද දෙවියන්වහන්සේ සිටී. අප වටා තිබෙන සැමදේම වෙනස් වෙතත්, සෙලවුනත් අප කිසි විටෙක සෙලවෙන්නේ නැත. සෑම කුණාටු, සියලු වෙනස්වීම් සිදුවුවත් ස්වාමීන්වහන්සේ අපට අලුයමහිදී උපකාර කරන්නාවූ දෙවියන්වහන්සේය. ස්වාමීන්වහන්සේ යහපත්ය. ස්වාමීන්වහන්සේට කල නොහැකි දෙයක් නැත.

*3 වෙනි පිටුවට ...*




**Echo of His Call**

*Christian YouTube Channel!*

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!


**English, Hindi, Tamil & Telugu**

Every day – 5.00 A.M.

**Tamil Sunday Service – 8.30 A.M.**

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)
REACHING NATIONS

*from your dearly beloved brother...*




# කැඳවීමේ ප්‍රතිරාවය



**"…. නමුත් ස්වාමින් කෙරෙහි විශ්වාසකරන තැනැත්තේ කරුණාවෙන් වටකරනු ලබන්නේය…."**
**(ගීතාවලිය 32:10)**

## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

**CHIEF EDITOR**
Angeline Selvakumari Henry, M.A., M.Ed.

**MANAGING EDITOR**
Pastor Alex Samson Sam, B.Th., M.Div.

**ADMINISTRATION**
Bro. N. Prakasam, M.A., General Manager

**EDITORIAL BOARD**
Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Dr. A. Richard Samuel, M.A., Ph.D.
Rev. Dr. K.R. Rajasekaran

**EDITOR, PUBLISHER & PRINTER**
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858

**CORE LEADERS**
Bro. K. Puratchivendan
Dr. Rabinder Boaz, M.S.
Bro. A. Edward Durai
Bro. A. Alvin
Bro. K. Abraham
Sis. Dhanalakshmi Chinnaiah

**E.mail ID**
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

**YOUTUBE CHANNEL**
Echo of His Call

**ප්‍රිය සහෝදර සහෝදරයිනි,,**
**අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මිහිරිමත් වූ නාමයෙන් ඔබට සුභ පතමි.**

අපගේ සේවයේ සියලුම අංශයන් වලට දෙවියන්වහන්සේ යහපත්ව සිටියේය. මැයි මාසයේ ග්‍රීෂ්ම සෘතුවේ නිවාඩුව සෑම අධ්‍යාපන අංශයකටම ලබා දෙන්නේය. එම නිසා මේ කාල වකවානුව තුළදී සභාවන් සමඟ එකතුවී ශුභාරංචිය ප්‍රකාශ කරමින් දේව රාජ්‍යය ගොඩනගන්න.

අද ලෝකයේ සිටින්නාවූ තරුණ තරුණියන් දකින විටදී ඔවුන් දෙවියන්වහන්සේගෙන් ඇත්වී දේව මෙහෙයන් වලටද සහභාගී නොවී කිසිම සේවයක් නොකර ජීවත් වන ආකාරය අප මුළු ලෝකය පුරාම දකින්නාවූ කාරණයකි. සභාවන් හා දෙමාපියන් මෙවැනි අය උදෙසා කිසිවක් කිරීමට නොහැකිව සිටිනවා ඇත.

එම නිසා ලෝකයේ සෙනඟත් දේශපාලකයිනුත් බොහෝ දේව දාසයිනුත් වැරදි ඉගැන්වීම් ඔවුන්ට උගන්වා මෙම තරුණ තරුණියන්ගේ ජීවිත අල්ලාගෙන ලෝකයේ වැරදි දේ වෙතට ආකර්ශනය වීමට පොළඹවයි. අද සභාවට පැමිණෙන්නාවූ තරුණ තරුණියන් බොහෝ සේ අඩු වී ඇත. මෙය ඉතාම වේදනාකාරී තත්වයකි. ඔවුන් දෙවියන්වහන්සේව අමතක කරමින් ඔවුන්ගේම මාර්ගවල ගමන් කරයි.

එසේන් මෙවැනි කාලයකදී දෙමාපියන් නායකයින් ස්වාමීන්වහන්සේගේ අභිමුඛත්වයට ගොස් අපගේ මෙම දූදරුවන්ව ආරක්ෂා කරදී ඔවුන් තුළට පිබිදීමක් එවන ලෙසට අප යාච්ඤා කල යුතුයි. මෙලෙස විනාශ වෙන්නාවූ තරුණ තරුණියන් උදෙසා කැපවී යාච්ඤා කරන්නාවූ කුඩා කණ්ඩායමක් අප සමඟ සිටී. ඔබත් මේ අය සමඟ එකතු වී යාච්ඤා කිරීමට කැමති නම් ඔබගේ නම අප වෙත එවන්න. ඔබ මුදල් එවීමට අවශ්‍ය නැත. නමුත් ඔබ අප හා සමඟ එකතු වී දෙවියන්වහන්සේගේ රාජ්‍ය පැමිණෙන්න කියාත් මේ දූ දරුවන්ගේ ගැලවීම උදෙසාත් යාච්ඤා කරන්න.

අප මෙම යාච්ඤාව ආරම්භ කරන්නේ සෑම දිනකදීම රාත්‍රී 10.00 ටය. අප මෙම දරුවන් උදෙසා හා තරුණ තරුණියන් උදෙසා යාච්ඤා කරමු. ඔබ ජීවත්වෙන්නාවූ දේශයේ වේලාවට අනුව අප රාත්‍රී 10.00 ට ආරම්භ කරන්නාවූ යාච්ඤාවට ඔබටද එක්විය හැකිය. දෙවියන්වහන්සේගේ සෙනඟ එක්සත් වී යාච්ඤා කරන විටදී ස්වාමීන්වහන්සේගේ හස්තය ක්‍රියාත්මක වන බව අපි දනිමු. ඔබගේ යාච්ඤාව කරණකොටගෙන තරුණ තරුණියන්ගේ ජීවිත වල යම් සාක්ෂි තිබේ නම් අප වෙත ලියා එවන්න. අපට හැකිනම් අප එය අපගේ සඟරාවෙහි පළ කරමු.

අප ඔබ උදෙසා යාච්ඤා කරමු. අප හා සමඟ අත්වැල් බැඳගෙන මේ මුළු ලෝකය දෙවියන්වහන්සේ වෙතට දිනාගන්නා පිණිස එකතු වෙන්න.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙක්ස් සැම්සන් සැම්**
(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com

**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ✪ BIBLECOR - Postal Courses (3 languages) ✪ Media Ministry ✪ Online Courses ✪ Theological Correspondence Courses (2 languages) ✪ Church Planting ✪ Nehemiah Bible Colleges ✪ Gospel Printing Press ✪ Great Commission Partners ✪ St. Paul's Matriculation School ✪ Crusades ✪ Community Development

1 පිටුවෙන්....

ඔබ ඔබගේ සියලුම කරදර වලදීත් ඔබගේ සටන්කාමී යාච්ඤාවන්ට තවමත් පිළිතුරු නොලැබී සිටින විටදීත් ඔබව සමහර බැමි වලින් බැඳ තිබෙන අවස්ථාවන් වලදීත් ඔබගේ එම සියලුම අවස්ථාවන් යේසුස් වහන්සේගේ නාමය කරණකොටගෙන කඩා බිඳ දමමින් අලුයම උදාවීමේදී ස්වාමීන්වහන්සේ ඔබට උපකාර කරන සේක. ***''...දෙවියන්වහන්සේ අලුයම්හිම එයට උපකාර කරනසේක.''*** *(ගීතාවලිය 46:5)*

## 1. අලුයම සිදුවෙන්නේ කුමක්ද?

### (a) අලුයම යනු නව සෘතුවක උදාවයි.

යුදෙව් දින දර්ශනයට අනුව අන්ධකාරය ඇතිවන්නේ 9 සිට 10 දක්වා කාලය තුලදීය. ඉන්පසු අලුයම් කාලය ආරම්භ වෙනු ලබයි. සාමාන්‍යයෙන් එය 12 ටත් පෙ. ව. 3.00 ටත් අතර කාලයයි. එය අඳුර පහවී ආලෝකය වෙනතට ගමන්කරයි. අලුත් දවසක් උදාවෙයි. අලුත් සෘතුවක් උදාවෙයි. එනම්, අප කුණාටුවේ සෘතුව තුළින්ද කැළඹීමේ හා වේදනාවන්ගේ සෘතුවන් තුලින්ද යා යුතු නැත. මන්ද අපට අලුත් සෘතුවක් උදාවෙයි.

### (b) අලුයම යනු සංක්‍රමනයේ සෘතුවකි.

අලුයම යනු, රාත්‍රීයත් දවාලත් අතර ඇතිවන සංක්‍රමනයයි. එක් සෘතුවකින් තවත් සෘතුවකට ඇතුල්වෙයි. එක් කාලයකින් තවත් කාලයකට ඇතුල්වෙයි. එසේම මේ සෘතුවට ඇතුල් වූ විට ගත යුතු පියවර කුමක්ද කියා සමහරු නොදනී. එය කැළඹීමේ කාලයක් හා සමානයි. මෙහිදී තීරණයක් ගැනීමට අසීරුයි. අලුත් සෘතුවකට ගමන්කරන කුමක් සිදුවෙයිද කියා භය වෙති. යක්ෂයා මේ ආකාර බොහෝ සිතුවිලි ඔබගේ මනසට ගෙනෙමින් ඔබට කැළඹීමට පත් කරයි. නමුත් දෙවියන්වහන්සේ මේ තුළින් බලාපොරොත්තු වන්නේ ඔබගේ ජීවිතයේ කිසියම් කඩා දැමීමක් සිදු කර යම් අලුත් දෙයක් ඔබගේ ජීවිතයේ සිදු කිරීමටයි. මෙහිදී දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතය දෙස බලන්නේ කිසියම් වෙනසක් ඇතිවීමේ කාලපරිච්ඡේදයක් ලෙසයි.

සභාවක් ලෙසත් පවුලක් ලෙසත් මෙන්ම පුද්ගලික ලෙසත් අපගේ ජීවිතයේ අලුත් අත්දැකීමකට සහ අලුත් වර්ධනයකට ඇතුලත් විය යුතුය. අපගේ ජීවිතය තුළ ඇති අඳුර බිඳ දමා ආලෝකමත් අලුයමකට ඇතුල්වෙමු.

### (c) අලුයම යනු ආත්මික සටනේ සෘතුවකි.

යම් දෙයක් කඩා බිඳ දමා ඉදිරියට යාම ඉතා ලෙහෙසි පහසු දෙයක් නොවන්නේය. යම්කිසි දෙයක් කඩා දමා එළියට යාමටද පහසු නැත. එය සටනකි. එය යුද්ධයකට සමකල හැකිය. ඔබ අඳුර මැද සිට එය බිඳදමා ආලෝකය වෙතට පැමිණීම ඉතා පහසුවෙන් සිදුවෙන්නාවූ දෙයක් නොවන්නේය. දෙවියන්වහන්සේ අපට අඳුර බිම දමා ආලෝකයට පැමිණිය යුතු කාලයකට කථා කරයි. අපගේ දරුවන්ට වෙනස්වීමකට කථා කරයි. එසේම අපගේ පවුලට, සභාවට විශාල බලපෑමක් කිරීමට උන්වහන්සේ බලාපොරොත්තු වෙයි. එය ආත්මික සටන්කාමී කාලයකි. ආත්මික ලෙස සටන්කරමින් බාධාවන් කඩා බිඳ දමා අප ඉදිරියටම යා යුතු කාලය පැමිණ ඇත.

සමහර විට අප අඳුරෙහිදී දකින දේවල් වෙනස් වෙන්නේ නැත කියන සිතුවිල්ලක් අපගේ මනසෙහි තිබීමට හැකිය. එළියා ශාරීරිකව, මානසිකව. ආත්මිකව හා හැඟීම් තුල ක්ලාන්තයට පත් වී සිටියේය. 'මට ජීවත්වීමට බැරිය' කියා ඔහු සිතුවේය. ඔහුගේ සේවා කාලයේදී ඔහු ඉතාම අඳුරු යුගයක ගමන්කලේය. බාල්ගේ අනාගතවක්තෘවරුන්ට විරුද්ධව ඔහු ජයගත් විටදී ඔහුට මරණ තර්ජන පවා ඇතිවිය. ඉතා ඉතා භයපත් විය. ඔහුට කිසිවක් කල්පනා කිරීමටද අසීරුවිය. එවිට ඔහු මෙසේ පවසනු ලැබීය. ***''....ස්වාමීන්වහන්සේ ඉතින් ඇත, දැන් ස්වාමීන්වහන්සේ. මාගේ ප්‍රාණය ගත මැනව, මක්නිසාද මාගේ පියවරුන්ට වඩා මම උතුම් නොවෙමියි.''*** *(1 රාජාවලිය 19:4)*



## තරුණයන් සහ කුඩා දරුවන් උදෙසා ගෝලීය දර්ශනය

### GLOBAL VISION FOR YOUTH & KID CARE

තරුණ පරම්පරාවේ ශුභ සාධනය උදෙසා දෙවියන්වහන්සේ අපට විශේෂ බරක් දී තිබේ. මුළු ලෝ තලයේම තිබෙන රටවල සිටින සියලුම තරුණ හා ළමුන් උදෙසා යාච්ඤා කිරීමටත් ඔවුන්ට ඉගැන්වීමටත් ඔවුන් සැමදෙනාම දේව රාජ්‍ය උදෙසා පුහුණු කිරීමටත් දෙවියන්වහන්සේ අපට දර්ශනයක් දී තිබේ.

එම නිසා ගෝලීය වශයෙන් අප දෙවියන්වහන්සේගේ මිනිසුන්ගේ පිරිණාවූ කුඩා කණ්ඩායම් වශයෙන් බරක් ඇතිව යාච්ඤා කිරීමට ඒ ඒ රටවල වේලාවට අනුව රාත්‍රී 10.00 ට යාච්ඤා කිරීම දැනටමත් ආරම්භ කර තිබේ. කරුණාකර ඔබත් මේ සඳහා එකතු වෙන්න.

එසේම ඔබගේ දරුවන් හා තරුණ තරුණියන් නිසාත් ආත්මික යුද්ධායුධ පැලඳගෙන යාච්ඤා කිරීමට කැමති නම් ඒ අයගේ නම සහ වයස අප වෙතට එවන්න. වයස අවුරුදු 35 ට වඩා අඩු අය පමණක් මේ සඳහා නම එවන්න. මේ තරුණ තරුණියන් උදෙසා අප දිගටම යාච්ඤා කරමු. මේ සඳහා අප වෙතට මුදල් එවන්න එපා. යාච්ඤා ඉල්ලීම් පමණක් එවන්න. ඔබගේ එම තොරතුරු පහත සඳහන් ලිපිනය වෙත යොමු කරන්න.

අපව සම්බන්ධ විය හැකි තොරතුරු:

**GLOBAL VISION FOR YOUTH & KID CARE**

**Echo of His Call**

Mobile & WhatsApp No : +91- 98412 71858 &
+91- 98410 71858

E.mail ID : sam@echoofhiscall.org

සෑම ස්ථානයකම අඳුර පැතිරී තිබෙන නිසා සෑම දෙයක්ම අවසානයි කියා ඔහු සිතුවේය. නමුත් කිසියම් වෙනස්වීමකට ඔහු මුහුණ දිය යුතු කාලයක සිටින බව ඔහුට අමතක විය. ඔහු දුටුවේ අඳුර පමණය. ඔහු ආලෝකය දුටුවේ නැත. දෙවියන්වහන්සේ ඔහුව කැඳවා තිබුනේ අඳුර බිඳ දමා ආලෝකය වෙතට පැමිණෙන පිණිසයි. මේ වසරේදී දෙවියන්වහන්සේ අපගේ සමහර අයව අඳුරේ තබා ඒ අඳුරේ අත්දැකීම් තුළ සිට එය කඩා බිඳ දමා අලුයම දෙවියන්වහන්සේගේ ක්‍රියාව අත්දැකීමේ කාලයක තබා ඇත.

***''කඩා දමන්නා ඔවුන්ට පෙරටුව නැගී ගියේය...'' (මීකා 2:13)***

ස්වාමීන්වහන්සේ අප ඉදිරියේ අන්ධකාර බලවේග කඩාගෙන ඉදිරියට යමින් අපව ආලෝකය කරා මඟපෙන්වනවා ඇත.

***''...ඔව්හු බිඳගෙන දොරටුව පසුකර එයින් පිටතට ගියෝය...'' (මීකා 2:13) ආමේන්***

ඔබව කුමනාකාර අන්ධකාර බලවේග අල්ලාගෙන සිටියත් එය ඔබව සීමාවත් තුළ තබාගෙන සිටියත් යේසුස් වහන්සේගේ නාමයෙන් ඔබව ඉන් මුදවා ඔබට පෙරටුව ස්වාමීන්වහන්සේ ගමන් කරමින් ඔබව ජයග්‍රාහී මාවතක ගෙනයන සේක.

***''ද්වාරයෙනි, තොපගේ හිස් ඔසවව්, සදාකාලික ද්වාරයෙනි, උසස්වව්, තේජසේ රජ්ජුරුවෝ ඇතුල්වනසේක.'' (ගීතාවලිය 24:7-9)*** එක් ඉතා අලංකාර ගීතයක මෙසේ පවසයි.

***''මා දකිමි මා ඉදිරියෙන් යන්නේ කවුරුන්ද කියා, මා පසුව යන්නේ කවුද කියාත් දනිමි, දෙවියන්වහන්සේගේ දූතයින් මා සමඟ සිටින සේක... මට විරුද්ධව නැගිටින්නාවූ සියලුම දේ බල රහිත වන්නේය...''***

***ස්වාමීන්වහන්සේ මා සමඟ සිටින නිසා මා බිය නොවෙමි.***

## 2. අප ඉදිරියට යා යුත්තේ කුමන දේ තුළින්ද?

අඳුරේ සිට අප ඉදිරියට යා යුතුයි. එනම්, අඳුර සමාන කරන්නේ කුමකටද?

### (a) නපුරේ ආධිපත්‍ය

අන්ධකාරයෙහි ඇති සෑමදේම දුෂ්ඨය. එය යක්ෂයාට සමාන කරයි. යක්ෂයා අන්ධකාරයේ අධිපතියාය. කොලොස්සි 1:13 හි මෙසේ පවසයි. ***''පියාණන්වහන්සේ අන්ධකාරයේ බලයෙන් අප මුදා, තමන් ප්‍රේමයේ පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප පමුණුවාගත්සේක.''*** ආධිපත්‍යයනු යම්කිසි දෙයක් පාලනය කරන්නාවූ බලයයි. අප පිටුපසින් සිටිමින් අපට බලපෑම් කරමින් අපට මිදෙන්නට නොහැකිව මේ අඳුරෙහි අපව තබාගෙන සිටින්නේ කවුද කියන හැඟීම ඇතිවෙනවා විය හැක. ඉදිරියට යාම යනු අන්ධකාරයේ ආධිපත්‍ය තබාගෙන ආලෝකයට පැමිණීමයි.

එමෙන්ම පාපයට අයත් සෑම දේම අන්ධකාරයට අයත්ය. එම පාපය අපව පාලනය කරනු ඇත. එය අපව යටත්කරගනු ඇත. ඔබ යම් යම් පුරුදු වලට ඇබ්බැහි වී එයින් ජය ගැනීමට නොහැකිව දුක් විඳිනවාද? දැන් කිතුණුවෝ පවා මෙවැනි පාපිශ්ඨවූ බලවේග වලට අසුවී එයින් නිදහස් වී පිටපත ඒමට බැරිව සිටී. අද විද්‍යාව හා තාක්ෂණයේ දියුණුවත් සමඟම බොහෝ දෙනා තාක්ෂණය හරහා පාපයට දොර හැර ඒ තාක්ෂනය තුළින් විවිධ පාපිෂ්ඨ දේ වලට යටත්ව සිටිනවා ඇත. යූ ටියුම් (YouTube) ටික් ටොක් (Tik Tok) තාක්ෂණය හරහා කිසිම වයස් භේදයකින් තොරව අසභ්‍ය දේ බැලීම තුළින් අද බොහෝ අය අඳුරු බලවේගයන්ට යටත්ව සිටී. අන්ධකාරයේ අධිපතියා මේ ජීවිත සම්පූර්ණයෙන්ම පාලනයට ගෙන තිබේ.

මේ සියලුම පාපිෂ්ඨ දේ තමාව විනාශ කරයි. කියා ඔවුන් නොදනී. අද අපගේ පවුල දෙවියන්වහන්සේ සමඟ තිබෙන්නාවූ සම්බන්ධතාවය, අපගේ සමාදානය ආදී දේ විනාශ වී තිබේ. අපගේ ආත්මය, ප්‍රාණය හා ශරීරය මෙවැනි දූෂිත දේට යටත්ව ඇත. ස්වාමීන්වහන්සේ මේ සෑම දේ තුළින්ම අපට ඉරරියට යාමට උපකාර කරන සේක.

අපගේ ජීවිතයේත් අපගේ පවුල තුළත් අපගේ සභාව තුළින් අපගේ සේවය තුළත් හා දෙවියන්වහන්සේ සමඟ ගමන් කරන්නාවූ ගමන තුලත් අපව පාලනය කරන්නාවූ සියලුම බලවේග බිඳ හෙලා අපි ඉදිරියටම ගමන් කරමු.

### (b) නොදැනුවත්කම

***එපීස 4:18 හි*** මෙසේ පවසයි. ***''ඔව්හු තමුන්ගේ තේරුම්ගැනීමෙන් අඳුරුව, තමුන් තුළ ඇත්තාවූ***

*6 වෙනි පිටුවට....*

Pray for **NEHEMIAH BIBLE**
**RESIDENTIAL / EVENING COLLEGE,**
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
Registered Candidate for Membership
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders &
Senior Pastors for the past 53 years
**Certificate in Theology : One year**
**Diploma in Theology : Two years**
Qualification : 10th Standard & above
Rush for admission!
**Contact : The Chairman, Nehemiah Bible College.**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මැයි:19-** භාෂා 16 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ මුද්‍රණාලය සහ එහි සේවය කරන අය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මැයි:20-** පාස්ටර් සැම් සෙල්වරාජ්ගේ දේශීය සහ විදේශීය සේවා ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මැයි:21-** කැඳවීමේ ප්‍රතිරාවය ප්‍රධාන දේවස්ථානය සහ ශාඛා සභාවල සිටින සියලු දෙනා ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මැයි:22**- පාස්ටර් සැම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය නපුරු දුෂ්ට බලවේග වලින් ආරක්ෂා වීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මැයි:23**- යාච්ඤා මැදිහත්කරුවන්, මහා ආඥාවේ මැදිහත්කරුවන් ඇතුළු අනෙක් සේවකයන් සහ ඔවුන්ගේ පවුල් වල අයට ස්වාමීන්වහන්සේගේ කරුණාව ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මැයි::24**- ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලේ සහ නෙහෙමියා බයිබල් විදුහලේ සෑම ක්‍රියාකාරකම් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මැයි:25**- ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවල දේවමෙහෙයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මැයි:26**- නෙහෙමියා බයිබල් විදුහලේ සෑම ක්‍රියාකාරකම් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මැයි:27**- යුධ බිය මැද වෙසෙන ජනතාවට දිව්‍යමය ආරක්ෂාව ලැබෙන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**මැයි:28**- කැඳවීමේ ප්‍රතිරාවය සංවිධානයේ සියලුරම සේවක පවුල් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මැයි:29**- දේශපාලන සහ ආගමික ප්‍රචණ්ඩත්වය මධ්‍යයේ කිතුණු සේවය ඉදිරියට යන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**මැයි:30**- දේව සේවය කරන සැමදෙනාම බලවත් කැපවීමෙන් සේවය කරන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**මැයි:31 -** සභාවේ කාන්තා සේවය තව ඉහළට එසවෙන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**2023 ජූනි මාසය**

**ජූනි:01-** නෙහෙමියා බයිබල් විදුහලට තවත් නේවාසිකව ඉගෙනගැනීමට සිසුන් ලැබෙන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**ජූනි:02-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් මුද්‍රණාලයේ වර්ධනය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූනි:03-** කැඳවීමේ ප්‍රතිරාවය ඔ ඔමඉැ සමාජ ජාලයට අලුරැත් ග්‍රාහකයක් එකතුවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජූනි:04-** යාච්ඤා මැදිහත්කරුවන්, මහාආඥාවේ මැදිහත්කරුවන් ඇතුළු අනෙක් සේවකයන් සහ ඔවුන්ගේ පවුල් වල අයට ස්වාමීන්වහන්සේගේ කරුණාව ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජූනි:05-** සියලුම දේව සේවකයන් හොඳ ශාරීරික සහ මානසික සුවය ඇතිව සිටීම ගැන යාච්ඤා කරන්න

**ජූනි:06-** ලෝකයේ සියලු ජාතීන් අතරේ එකමුතුකමත් දියුණුවත් උදෙසා යාච්ඤා කරන්න

**ජූනි:07-** සියලුම කිතුණු සංවිධානය වෙත ආශිර්වාද කරමින් යාච්ඤා කරන්න

**ජූනි:08-** ශුභාරංචිය නොලැබූ අයට එය ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජූනි:09-** දේව රාජ්‍යය ගැන පුළුල් දර්ශන ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජූනි:10-** වෛරස් තුළින් පැතිරීයන උණ රෝග වලින් පීඩා විඳින අයට සුවය ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජූනි:11-** දරුවන් සහ තරුණ තරුණියන් යේසුස්වහන්සේ තම ජීවිතයට ගැලවුම්කරුවාණන් ලෙස පිලිගැනීම පිනිස යාච්ඤා කරන්න

**ජූනි:12-** පාස්ටර් සැම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අයට නිරෝගි සුවය ලැබීම ගැන යාච්ඤා කරන්න

**ජූනි:13-** හැකි සෑම අයුරින්ම දේව සේවය වර්ධනය වීම ගැන යාච්ඤා කරන්න

**ජූනි:14-** නෙහෙමියා බයිබල් විදුහලට ඉදිරි වසර සඳහා සිසුන් ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජූනි:15-** ලෝකයේ සෑම රටකම නායකයින් ගැන යාච්ඤා කරන්න

**ජූනි:16-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලට ඉදිරි වසර සඳහා සිසුන් ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජූනි:17-** යාච්ඤාවෙන් හා මුල්‍යමය උපකාර තුළින් දේව සේවයට උපකාර කරන සැම දෙනා ගැන යාච්ඤා කරන්න

**ජූනි:18-** කැඳවීමේ ප්‍රතිරාවය සහකාර කතෘවරුන් ගැන යාච්ඤා කරන්න

*4 පිටුවෙන්....*

***අඥානකම නිසාද තමුන්ගේ සිත් දැඩිකම නිසාද දෙවියන්වහන්සේ කෙරෙන්වූ ජීවිතයට විදේශව සිටිති."***

නොදැනුවත්කම දේව රාජ්‍යයට ඇති විශාලම බාධාවකි. යක්ෂයා බලාපොරොත්තු වන්නේ අප දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ කාරණාවන් ගැන නොදැනුවත්කමින් ජීවත්වෙයි. යක්ෂයා ඉතාම රැවටිලිකාරයෙකි. නොදැනුවත්කමින් අපව තබා ගැනීමට ඌ උත්සාහ දරයි. *2 කොරින්ති 4:4* හි මෙසේ පවසයි. ***"නොඇදහිලිකාරවූ ඔවුන් තුල දෙවියන්වහන්සේගේ ස්වරූපයවූ ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ ශුභාරංචි ආලෝකය නොබැබළෙන පිණිස මේ ලෝකයේ දෙවියා ඔවුන්ගේ සිත් අන්ධකලේය."***

***"අපගේ මනස අන්ධකාරව තබාගෙන තිබේ"*** යනුවෙන් පවසන්නාවූ කාරණය ගැන අපට සමහර විටදී තේරුම්ගැනීමට අසීරුය. දේව වචනය පවසන ආකාරයට මෙවැනි නොදැනුවත්කමින් ඉදිරියට යාමට ස්වාමීන්වහන්සේගෙන් උපකාරය ඉල්ලන්න. ස්වාමීන්වහන්සේගෙන් ප්‍රඥාව ඉල්ලන්න. එය ස්වාමීන්වහන්සේ අඩුවක් නොමැතිව දෙන සේක. *(යාකෝබ් 1:5)*

අද තාක්ෂණයේ දියුණුව කරණකොටගෙන බයිබලය බොහෝ භාෂාවන් වට පරිවර්තනය කර ඇති බැවින් අපට අවශ්‍ය කාරණාවන් ඕනෑම වේලාවක සොයාගෙන කියවීමට හැකි බැවින් මා ඉතා සංතෝශ වෙමි. නමුත් Online හරහා අපගේ අතෙහි බයිබලය තබාගෙන තිබුනද බයිබලය අපගේ හදවතෙහි හා මනසෙහි නොමැති කාරණය නිසා ඉතා කණගාටු වෙමි.

මුල් කාලයේදී යම්කිසි බයිබල් පදයකට සමාන බයිබල් පදයක් සොයාගැනීමට අවශ්‍ය වූ විටදී මිනිසුන් එය බයිබලය තුළින්ම සොයාගනී. නමුත් අද මිනිසුන් එය Google හරහා ඉතා පහසුවෙන්ම සොයා ගනී. දිනකදී මෙම Online (ඔන්ලයින්) ක්‍රමය නැති වූ විටදී කුමක් සිදුවේද කියා මා නොදනී. අද යක්ෂයා අපට මෙවැනි ඉතාම පහසු ක්‍රම මඟින් දේව වචනය සොයා ගැනීමට අවස්ථාවන් ලබා දී අප එයට හුරුවී ඒ තුළට ඇබ්බැහි වීමට සලස්වනවා අද එය නැති වූ විටදී අප දේව වචනය නොමැතිකමේ විශාල ප්‍රශ්නයකට මුහුණදෙන්නෙමු. එම නිසා අප නිතරම බයිබලය කියවමු. එය මෙනෙහි කරමු. එය අපගේ හදවතේ ලියා තබා ගනිමු.

## 3. ඉදිරියට යන්නේ කොහාටද?

**ආලෝකය - ආලෝකය යනු කුමක්ද?**

### (a) ආලෝකය යනු තේරුම්ගැනීමකි.

***"ආලෝකය අන්ධකාරයෙහි බබළයි. අන්ධකාරයද එය ග්‍රහණයේ නොකෙලේය."*** *(යොහාන් 1:5)*

ආලෝකය තිබෙන ස්ථානයෙහි බලය තිබේ. දිව්‍යමය ආලෝකය තුළින් අපට ආත්මික ශක්තිය ලැබේ. අපගේ මනසින් දෙවියන්වහන්සේගේ කාරණාවන් පැහැදිලිව දැකීමට හැකියාව ලැබේ. ආලෝකය අපට එළිදරව්වක් ගෙනදෙයි. බයිබලය දෙවියන්වහන්සේගේ වචනයයි. එය ස්වාමීන්වහන්සේගේ සත්‍යතාවයයි හා එය ස්වාමීන්වහන්සේගේ ආලෝකයයි. ***"ඔබගේ එළියත් සැබෑකමත් එවූව මැනව, ඒවා මා ගෙනයෙත්වා. ඒවා ඔබගේ ශුද්ධවූ කන්දටත් ඔබගේ මණ්ඩපවලටත් මා පමුණුවත්වා."*** *(ගීතාවලිය 43:3)* ආලෝකයක් නොමැති නම් සත්‍යතාවයක් නැත. අපට ආලෝකය අවශ්‍ය නම් අප දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයට යා යුතුය. එසේ නොමැති වුවහොත් අපට තවමත් සිටින්නාවූ ස්ථානයෙහිම සිටීමට සිදුවෙයි. දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය නැමති පර්වතය වෙතට අප යා යුතුය.

### (b) ආලෝකය යනු පරිවර්ථනයකි.

ඉදිරියට යාම යනු යේසුස් වහන්සේ තුළින් පරිවර්ථනය ලැබීමකි. ආලෝකය දුටු විටදී සාවුල් පාවුල් විය. ආලෝකය යනු දෙවියන්වහන්සේගේ ශුභාරංචියයි. ***"එසේය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මුහුණෙහි දෙවියන්වහන්සේගේ තේජස දැනගැන්ම නැමති ආලෝකය බැබළෙන පිණිස, අපගේ සිත්වල බැබළුවේ අන්ධකාරයෙන් ආලෝකය බැබළෙන්ට කීවාවූ දෙවියන්වහන්සේය."*** *(2 කොරින්ති 4:6)* එනම්, ආලෝකය යනු, දෙවියන්වහන්සේගේ මහිමයයි. එය බැබළෙන විට එයින් පරිවර්ථනයන් සිදු කරයි. ***"අපි සියල්ලෝද මුහුණ වැස්මක් නැතුව, ස්වාමීන්වහන්සේගේ තේජස කැඩපතකින් මෙන් දක්වමින්, ආත්මයාණන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ කෙරෙන් තේජසට එම ස්වරූපයට වෙනස් කරනු ලබමුව"*** *(2 කොරින්ති 3:18)* දෙවියන්වහන්සේගේ වචනයෙන් අපට ලැබෙන්නාවූ දැනමුතුකම් තුළින් ඕනෑම කෙනෙකුගේ ජීවිතයෙහි පරිවර්ථනයක් සිදුවීමට පුළුවනි.

ශුභාරංචිය ආලෝකය ගෙනදෙයි. ආලෝකය අපව පරිවර්ථනය කරයි. අප දේව ගෘහයට ගොස් දේශනා කරන්නේ ඇයි? අප දේවස්ථානයට ගොස් වාඩිවී පැයක පමණ දේශනාවට ඇහුම්කන් දෙන්නේ ඇයි? එය අපගේ නුවණෙන් කරන්නාවූ ක්‍රියාවක් නොව එය අපගේ ජීවිතයෙහි සිදුවෙන්නාවූ පරිවර්තන ක්‍රියාවකි. යේසුස් වහන්සේගේ පරිවර්ථන ක්‍රියාව සිදුවන විට අපට ඉදිරියට යාමට පුළුවන්කමක් ලැබෙයි. අපට ඉදිරියට යාමට මහත් බලයක් ලැබෙනු ඇත.

*9 වෙනි පිටුවට....*

## කරුණාකර අප ප්‍රධාන සභාවේ සේවාවන් උදෙසා යාච්ඤා කරන්න.

| | |
|---|---|
| 1. යාච්ඤා සේවය | - පැය 24 පුරා |
| 2. බයිබල් තැපැල් පාඩම් මාලාව | - ඉංග්‍රීසි, දෙමල හා හින්දි |
| 3. කැඳවීමේ ප්‍රතිරාවය | - මාසික සඟරාවන් දෙමල, ඉංග්‍රීසි, මලයාලම්, තෙලගු, හින්දි, මරාති, කන්නඩා, බෙංගාලි, ගුජරාති, ඔරියා, නේපාලි, අසාමි, පංජාබි, උර්දු, සිංහල සහ අප්‍රිකානාස් |
| 4. නෙහෙමියා බයිබල් විදුහල | |
| 5. තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව | - දෙමල සහ ඉංග්‍රීසි |
| 6. පුහුණුවීමේ වැඩසටහන් | |
| 7. චිත්‍රපටි සේවය සහ ශුභ ආරංචි රැස්වීම් | |
| 8. ශුභ ආරංචි පත්‍රිකා මුද්‍රණය කිරීම | - ප්‍රකාශනය කිරීම. |
| 9. මුද්‍රිත සේවය පවත්වාගෙන යාම. | |
| 10. ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසල | |
| 11. සබත් පාසල | - ඉරිදා පෙ.ව 8.30 |
| 12. දෙමළ භාෂාවෙන් දේව මෙහෙය | - ඉරිදා පෙ.ව 5.00, 7.00 හා 10.00 |
| 13. තෙලෙගු භාෂාවෙන් දේව මෙහෙය | - ඉරිදා ප.ව 4.00 |
| 14. හින්දි භාෂාවෙන් දේව මෙහෙය | - ඉරිදා ප.ව 5.00 |
| 15. මලයාලම් භාෂාවෙන් දේව මෙහෙය | - ඉරිදා ප.ව 5.00 |
| 16. ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවෙන් දේව මෙහෙය | - ඉරිදා ප.ව 6.00 |
| 17. පත්‍රිකා බෙදා හැරීම. | - ඉරිදා ප.ව 2.30 |
| 18. පාලක වරුන්ට උපදෙස් දීම. | - ඉරිදා ප.ව 4.00 |
| 19. කාන්තා යාච්ඤාව | - බදාදා ප.ව 5.30 |
| 20. සති මැද නමස්කාර දේව මෙහෙය | |
| 21. පුරුෂයින්ගේ යාච්ඤාව | - සිකුරාදා ප.ව 8.00 |
| 22. සෙනසුරාදා දේව මෙහෙය | - ප.ව 5.00 |
| 23. සේවකයින්ගේ රැස්වීම | - සෙනසුරාදා ප.ව 6.00 |
| 24. ගෘහ රැස්වීම් | - අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා ප.ව 6.30 |
| 25. විශේෂ රාත්‍රි භෝජනය | - පළමු ඉරිදා උදෑසන 5.30 |
| 26. දෙමාපියන්ගේ යාච්ඤාව | - පළමු ඉරිදා ප.ව 4.00 |
| 27 උපවාස යාච්ඤාව | - පළමු සෙනසුරාදා පෙ.ව 9.30 |
| 28. සර්ව රාත්‍රි යාච්ඤාව | - දෙවෙනි සිකුරාදා ප.ව 9.30 |
| 29. තරුණ හා ළමා යාච්ඤාව | - ප.ව. 10.00 දිනපතා |
| 30. දිනපතා උදෑසන දේව මෙහෙය | - පෙ. ව 5.00 |
| 31. කාර්යාල මණ්ඩලයේ මෙනෙහි කිරීම - දිනපතා පෙ.ව 9.00 | |
| 32. කාර්යාල සේවය | - දිනපතා පෙ.ව 9.00 සිට ප.ව 9.00 |

Pray for **ST. PAUL'S MATRICULATION SCHOOL** Medavakkam, Chennai.

Division of ECHO OF HIS CALL

***needs Christian Teachers & Staff for the following categories / jobs:***

- Physical Education
- Maths
- Physics
- Kindergarten
- Hindi
- English
- Chemistry
- Security staff &
- House keeping staff
- Secondary Grade

Phone & WhatsApp No. **98410 71858**



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## "...කියවන්නා තේරුම් ගනීවා...." *(මතෙව් 24:15)*

## GRACE OF GOD!

එදින ඉරුදින දවසකි. ඉතාම අලංකාර වූ උදෑසනකි. මගේ සීයා, ආච්චි, පියා, මව හා සෑම දරුවන්ද ඉතා අලංකාර ලෙස හැඳ පැළඳගෙන දකුණු ඉන්දියාවෙහි තිබෙන්නාවූ නෙල්අරෙයික්කෝනම් යන ගමෙහි පිහිටා තිබූ දේවස්ථානයට ඉතා සතුටින් යමින් සිටියෙමු. මේවන විට මගේ වයස අවුරුදු 12 කි. සෑම දෙනාටම යම් කිසි සුදුසුකමක් තිබූ නමුත් මට කිසිම සුදුසුකමක් නොතිබුණි. මා කිසිම වටිනාකමක් නොමැති කෙනෙක් කියා මා සිතුවෙමි. දේව සභාවේදී මා යේසුස් ක්‍රිස්තුස්වහන්සේට නමස්කාර කරමින් සිටියෙමි. එවිට මගේ මනස තුළ විශාල ප්‍රශ්නයක් ඇති වීමට පටන්ගත්තෙමි. එනම්, සියලුම මනුෂ්‍ය ජාතීන්ට සුදුසුකමක් දෙන පිණිස යේසුස් වහන්සේ ස්වර්ග රාජ්‍යයේ සියලු සැප සම්පත් අත්හරමින් මේ පොළොවට පැමිණුනේය. මාගේ පාලකතුමා මෙන් මා දේව දාසයෙක් වෙන්නේ නැත්තේ ඇයි? කියන ප්‍රශ්නය මා මගෙන්ම ඇසුවෙමි. එදින දේව මෙහෙය තුළදී ඉතා පැහැදිලි ලෙස දෙවියන්වහන්සේ මගේ හදවතට කථා කලේය.

එදින එම පාලකතුමා සාමුවෙල් ප්‍රොපේතවරයා ගැන කථා කලේය. 1 සාමුවෙල් 3 වන පරිච්ඡේදය තුළින් ඔහු කථා කරනු ලැබීය.

1 සාමුවෙල් 3:1-4 දක්වා ඇති කොටස කියවන විටදී එම දේව වචනය තුළ පවසන්නේ එම කාල වකවානුව තුළදී දෙවියන්වහන්සේගේ වචනය ඉතා දුර්ලභව ඇති බවයි. දෙවියන්වහන්සේගේ එළිදරව් වීමක්ද තිබුනේ නැත. එවැනි කාල වකවානුවක් තුළදී දෙවියන්වහන්සේ සාමුවෙල්ට කථා කරනු ලැබීය. දිනක් ඒලි පූජකයා

*''අධිපතීන් සමඟ හිඳුවන පිණිසත්, මහිමයේ සිංහාසනයේ උරුමකරවන පිණිසත්, උන්වහන්සේ දුප්පතා ධූලියෙන් නැගුටුවනසේක. දිළින්දා කසළ ගොඩින් ඔසවන සේක....'' (1 සාමුවෙල් 2:8)*

නිදාගැනීමට ගිය අවස්ථාවේදී දෙවියන්වහන්සේ සාමුවෙල්ට කතා කරනු ලැබීය. මෙසේ දෙවියන්වහන්සේ සාමුවෙල් නැමති පොඩි කොලුවෙක්ව ඉශ්‍රායෙල්හි විනිශ්චයකාරයෙක් ලෙසත් ප්‍රොපේතවරයෙක් ලෙසත් එසෙව්වේය කියා පාලකුමා දේශනා කරනු ලැයබී.

මේ වචනය මගේ ජීවිතයට ඉමහත් බලපෑමක් ඇති කරනු ලැබීය.

1. මා මගේ සභාවටත් සෙනගටත් ප්‍රේම කලෙමි. මා සෑම සෙනුසරාදා දිනකම දේවස්ථානයට ගොස් එය පවිත්‍රකර පුටුවල දූවිලි ගසා පවිත්‍ර කර ඒවා පිලිවෙලකට තැබුවෙමි. දේවස්ථානයේ පිටත වත්තද මා පිරිසිදු කලෙමි. සංගීත භාණ්ඩ සියල්ලමද මා පිරිසිදු කලෙමි. පසුව මා සභාවේ නඩත්තු අංශයේ කණ්ඩායමට එකතු වුනෙමි.

2. මා මගේ පාලකුමාට උපකාර කරමින් ඔහුගේ බෑගය ඔසවාගෙන ගියෙමි. සපත්තු පිස දැමුවෙමි. ඔහුගේ තුන් වේලම ආහාරය ඔහු වෙතට රැගෙන ගියෙමි. එසේම අනෙකුත් දේව දාසයින්ටද මෙලෙසම මා උපකාර කලෙමි.

3. මගේ සභාවේ සාමාජකයින් සමඟ මා ඉතා සහයෝගයෙන් කටයුතු කලෙමි. මා සියලුදෙනාටම උපකාර කල අතර සියලුදෙනාටම මාව ප්‍රිය පුද්ගලයෙක් විය.

අන් අයට උපකාර කිරීමේ ස්වභාවය මා තුල තිබූ නමුත් මට කථා කිරීමේ හැකියාව නොතිබුණි. මට අමතකවීමේ ස්වභාවයක් තිබුණි. මට උසස් අධ්‍යාපනයක්ද නොතිබුණි. මගේ මිතුරන් සමඟ සසඳන විටදී මට තිබුනේ කුඩා තලෙන්ත හා දීමනාවන් පමණි.

මගේ වයසේ මගේ මිතුරන් ඉතා උසස් පාසල්වල අධ්‍යාපනය හැදෑරූයෙව්. ඔවුන් 'කරාතේ' වැනි ක්‍රීඩාවන් තුළින් ඉහළටම ගමන් කළා. නමුත් දෙවියන්වහන්සේ මාව සභාව තුළ පමණක් වැඩ කිරීම පිණිස තබා තිබුණේය.

දෙවියන්වහන්සේ සාමුවෙල්ව පහත්ව සිටි ස්ථානයෙන් එසෙව්වාක් මෙන් දෙවියන්වහන්සේ මාවද එසෙව්වේය. වසර 23 ක් මා රාජ්‍ය සේවකයෙක් ලෙස රැකියාවෙහි නියුතු වූ විටදීත් දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයේ සෑමදාම මා සමඟ තිබුණේය. මගේ විශ්වාසවන්ත සේවය නිසා රජයේ රැකියාවෙහි නිරත සිටින අතර තුරදීම දේව සේවය කිරීමටද මට අවස්ථාව ලැබුණි.

දෙවියන්වහන්සේ මගේ සෑම දේ තුළින් මාව උසස් කිරීමට පටන්ගත්තේය.

සාමුවෙල් කුඩාකල සිටම දේව මාළිගාවේ වැඩ වලට උදව් කිරීමට පටන්ගත්තේය. එම නිසා දෙවියන්වහන්සේ ඔහුව ඉශ්‍රායෙල්හි මහත් ප්‍රොපේතවරයෙක් ලෙසත් විනිශ්චයකාරයෙක් ලෙසත් පත් කලේය.

ඔබත් ඔබගේ සභාවට ප්‍රේම කරමින් ඔබගේ පාලකතුමාත් සමඟ එකතුව සේවය කරනවා නම්, සැබවින්ම උන්වහන්සේ ඔබට ආශිර්වාද කරයි.

************

*6 වෙනි පිටුවෙන්....*

මා විශ්වාස කරනවා මා යාච්ඤා කරනවා දෙවියන්වහන්සේ අපට ඉදිරියට යාමට උපකාර කරන්නය කියා, අලුයමදී යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැගිටුනේය. පාපයේ සියලු බලයන් කඩා බිඳ දැමුවේය. සොහොන තුළින් පිටත පැමිණුනේය. මෙය ඉතා බලවත්වූ සත්‍යතාවයකි. යේසුස් වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම මනුෂ්‍යයන් දුටුවේ අලුයමදීය.

ඔබ ඉදිරියට යන විටදී අලුයමහිදී දෙවියන්වහන්සේගේ පොරොන්දු ඔබට දැකීමට හැකිය. බලවත් ක්‍රියාවන් සිදුවන්නේ අලුයමහිදීය. ''***ඉදින් ක්‍රිස්තුස්වහන්සේ නැගුටුවන නොලැබූසේක් නම්, අපගේ දේශනා කිරීම නිෂ්ඵලය. නුඹලාගේ ඇදහීමත් නිෂ්ඵලය.'' (1 කොරින්ති 15:14)*** අලුයම කාලයේදී බලය තිබේ. මෙම වර්ෂය අලුයමේ කාලයයි.

අවසානයේදී, අපි යාකොබ් ගැන කථා කරමු. පළමුව, යාකොබ් අලුයම් වෙන තුරු දෙවියන්වහන්සේ සමඟ පොරබැදූ බව දේව වචනයෙහි සඳහන් කර තිබේ. එහිදී ඔහුගේ ජීවිතයෙහි වෙනසක් සිදුවූ අතර ඔහු ඉදිරියටම ගියේය.

***''යාකොබ් හුදකලාව සිටියේය, එවිට මනුෂ්‍යයෙක් පහන්වනතුරු ඔහු සමඟ පොරබැදුවේය. ඒ තැනැත්වහන්සේ ඔහුගෙන් ජය නොලැබෙන බව දුටු විට ඔහුගේ කළවා සන්ධියට ගැසූසේක, යාකොබ්ගේ කළවා සන්දියද උන්වහන්සේ සමඟ පොරබදද්දී ඇදී ගියේය. උන්වහන්සේ කථා කොට, පහන්වෙන බැවින් මා යන්න හැරපන්නැයි කීසේක. ඔහුද, ඔබ මට ආශිර්වාද කලොත් මිස නැත්නම් යන්ට නොහරිමියි කීය.'' (උත්පත්ති 32:24-26)***

ඔබට යාච්ඤා කිරීමට යම්කිසි කාරණාවක් තිබේ නම් ඒ ගැන ඔබ දිගටම යාච්ඤා කරන්න. ඒ සඳහා ඔබට උපකාර ලැබෙන තුරුම යාච්ඤා කරන්න. එම යාච්ඤාව නතර නොකරන්න. යාකොබ් මෙන් නොකඩවාම ඔබත් යාච්ඤා කරන්න. අලුයම් වේලෙහිදී ඔබගේ ජීවිතය ඉදිරියට යාමට සිදුවෙයි.

දෙවනුව, යාකොබ්, තම සහෝදරයා ඔහුව මරා දමයි කියා භය වී ඔහුට සාමයේ පඬුරු සහ පූජාවට අවශ්‍ය දේ ඒසව් වෙත යැවීය. එසේ යැවීම කරණකොටගෙන තම සහෝදරයාගේ තරහාව එතනින් අවසන් වෙයි කියා ඔහු සිතුයෙව්. නමුත් සිදුවූයේ කුමක්ද? දෙවියන්වහන්සේ විසින් සහෝදරයන් දෙදෙනා අතර කිසිම බාධාවකින් තොරව සමගිකමක් හා සමාදානයක් ඇති කලේය. යාකොබ් දෙවියන්වහන්සේ පොරබැදූ විටදී දෙවියන්වහන්සේ ඔහුගේ කලවයට අත ගැසුවේය. ඒ නිසා ඔහු නොන්ඩි ගැසීය. එවිට ඔහුගේ ඇවිදීම වෙනස්විය.

දෙවියන්වහන්සේ අපගේ ජීවිතයේද අපගේ ඇවිදීම වෙනස් කල යුතුයි. උන්වහන්සේ ක්‍රියාකරන විට අපගේ ඇවිදීම වෙනස් වෙයි. එවිට අප සිටින්නට

RNI NO. TN/SIH/2006/17846

යන්නේ අප සිටි ආකාරයෙන් නොව, අපගේ ඉදිරියට යාම කාරණාකොටගෙන අලුත් දෙයක් සිදුවෙයි. අලුත් සෘර්තුවක් ආරම්භ වෙයි.

අන්ධකාරයේ ක්‍රියාවන් කඩා බිඳ දමා ආලෝකයෙන් බැබලෙන්නාවූ ඉදිරියට යාමේ කාලයක් විශාල වෙනසක්, විශාල ආත්මික වෙනසක් අප ඉදිරියෙහි තිබෙයි කියා මා විශ්වාස කරමි. පුද්ගලික ලෙසත් පවුලක් ලෙසත් සභාවක් ලෙසත් ජාතියක් ලෙසත් මේ දේ සිදුවෙයි කියා මා සිතමි. අලුයම්හිදී යමක් සිදු වෙයි.

අප තුළින් අලුත් දෙයක් හට ගැනීමට අවශ්‍යයි. මවක් තම දරුවාව නියම කාලයේදී මෙලොවට බිහි කරනවාක් මෙන් බිත්තරය පැලී නව ජීවයක් ඇති වෙනවාක් මෙන් ආලෝකයේ නව සෘතුවක් අප බලාපොරොත්තු වෙමු.

අප සැම දෙනාම ඉදිරියට යමු. ස්වාමීන්වහන්සේ මේ නව උදාවට උපකාර කරන සේක. අප බලාපොරොත්තු සහිතව ඉදිරියට යමු.

ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා!

************

## කැඳවීමේ ප්‍රතිරාවය

සැම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 2nd MAY 2023.
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**